## මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශුම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය ප්‍රථම කොටස - 2014
### (ප්‍රථම සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 නොවැම්බර්)

## BLE 103 - ලේඛකත්වය හා සන්නිවේදනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න දහයකින් (10) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) උත්තර පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) විභාගය අවසානයේදී සියලුම උත්තර පත්‍ර එකට ගැට ගැසිය යුතුය.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## I කොටස

01. "සන්නිවේදනය" යනු කුමක්දැයි පැහැදිලි කොට සන්නිවේදන ක්‍රියාවලියක මූලිකාංග විස්තර කරන්න.

02. "මානව සන්නිවේදනය ඉතිහාසයේ ජනමාධ්‍යවල ප්‍රභවය මෑතකාලීන සංසිද්ධියකි." පැහැදිලි කරන්න.

03. <u>එක්කෝ</u>

භාෂාව පිළිබඳ ඔබ දන්නා නිර්වචනයක් ඇසුරින් මානව භාෂාවේ ස්වභාවය විවරණය කරන්න.

<u>නැතහොත්</u>

"භාෂණය හා ලේඛනය වශයෙන් භාෂාවේ ප්‍රධාන ස්වරූප දෙකකි." සිංහල භාෂාව ඇසුරින් පැහැදිලි කරන්න.

04. ප්‍රවෘත්ති රචනය පිළිබඳ "යටිකුරු පිරමිඩ ආකෘතිය" ආකෘතිය ඇසුරින් පහත සඳහන් ප්‍රවෘත්ති වාර්තාව විවරණය කරන්න. සුදුසු සිරස්තලයක්ද සපයන්න.

කොළඹ මාර්ගයන්හි පවතින අධික වාහන තදබදය අවම කිරීම සඳහා මොරටුව සහ කොළඹ කොටුව දක්වා ගාලු පාරේ මංතීරු දෙකක විශේෂ බස් රථ සේවාවක් ආරම්භ කිරීමට අවධානය යොමුව ඇතැයි ප්‍රවාහන නියෝජ්‍ය ඇමතිවරයා පැවසීය.

ඒ සඳහා මොරටුව විශ්වවිද්‍යාලය මගින්ශක්‍යතා අධ්‍යයනයක්ද සිදුකරමින් පවතින බවත් ප්‍රවාහන අමාත්‍යාංශයේදී ඊයේ (28 දා) පැවැති මාධ්‍ය හමුවකදී හෙතෙම මේ බව සඳහන් කළේය.

ඒ අනුව ගාලුපාර තවදුරටත් ප්‍රමාණයෙන් පළල් කිරීමට සිදුවනු ඇති අතර එම පාරේ මැද මං තීරු දෙකෙහි මෙම විශේෂ බස් රථ ධාවනය කරන්නට ඉඩ සකසා අනෙක් මංතීරු තුළ වෙනත් වාහන ධාවනය සඳහා පහසුකම් සලසන බවද ඒ මහතා පැවසීය.

සාමාන්‍ය බස් රථවලට වඩා මෙම විශේෂිත බස් රථ දිගින් යුක්තවන අතර ඒවා විදෙස් රටවලින් මෙරටට ගෙන ඒමට සිදුවනු ඇති බවද හී ප්‍රවාහන නියෝජ්‍ය ඇමැතිවරයා මෙය තරමක කාලයක් ගතවන විශාල ව්‍යාපෘතියක් බවද වැඩිදුරටත් කියා සිටියේය.

05. පහත සඳහන් මාතෘකාවලින් <u>02 ක්</u> පිළිබඳ සටහන් ලියන්න.

(i) ගුවන්විදුලි මාධ්‍ය භාෂාව
(ii) මානව සන්නිවේදනයේ මුද්‍රණ යුගය
(iii) වාච්‍ය හා අවාච්‍ය සන්නිවේදනය
(iv) පුවත්පත් සිරස්තල

## II කොටස

06. "නූතන සිංහල අක්ෂර මාලාව අක්ෂර 60 කින් යුක්තය." පැහැදිලි කරන්න.

07. (i) සිංහල ලේඛන ව්‍යවහාරයේ මූර්ධජ - ණ යෙදෙන රටා 4 දක්වන්න.

(ii) සිංහල අක්ෂර වින්‍යාසයේ පොදු වැරදි 10 ක් දක්වා ඒවායේ නිවැරදි රූප දක්වන්න.

08. නිර්මාණාත්මක ලේඛනය හා ශාස්ත්‍රීය ලේඛනය අතර පවත්නා වෙනස්කම් නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

09. (i) ශාස්ත්‍රීය ලේඛනයක මූලාශ්‍රය දැක්විය යුත්තේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ii) සම්මත එක් ක්‍රමයක් යටතේ පහත සඳහන් මූලාශ්‍රය ග්‍රන්ථ නාමාවලියක දක්වන්න.

(අ) ඒකකර්තෘක ග්‍රන්ථයක්
(ආ) සඟරාවක පළවූ ලිපියක්
(ඇ) පුවත්පත් ලිපියක්
(ඈ) සංස්කරණය කරන ලද ග්‍රන්ථයක ඇතුළත් ලිපියක්

10. පහත සඳහන් මාතෘකාවලින් 02 ක් පිළිබඳව සටහන් ලියන්න.

(i) අමිශ්‍ර සිංහල භෝධිය
(ii) අල්පප්‍රාණ - මහාප්‍රාණ භේදය
(iii) උද්ධෘත භාවිතය
(iv) ලේඛන ක්‍රියාවලිය